www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වැඩ වර්ජනයේ නියුතු ශ්‍රී ලංකාවේ ගුරුවරුන්ට සමාජවාදී ඉදිරි දර්ශණයක්

## සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය
## 2007 සැප්තැම්බර් 13

අද දින ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගුරුවරුන් දස දහස් ගනනින් එක් දින වැඩ වර්ජනයකට බසිනු ඇත. ආපසු යුද්ධයට බැසගැනීම යුක්ති සහගත කිරීම සඳහා ආන්ඩුව විසින් අවුලුවාලන ලද ජනවාර්ගික වෛරයේ වාතාවරනයට යටනොවූ දෙමල හා මුස්ලිම් ගුරුවරුන් ද තමන්ගේ සිංහල සහෝදරවරුන් සමග අත්වැල් බැඳ මෙම අරගලයට එක්ව සිටිති. මෙම විරෝධතා වැඩ වර්ජනය සිදු වන්නේ පිම්මේ ඉහල යන ජීවන වියදමට එරෙහිව උග්‍ර අසහනයක් වැඩී පැතිරී යන තතු තුල ය.

වෘත්තීය සමිති අද දින වැඩ වර්ජනය එක ප්‍රශ්නයකට පමනක් සීමා කර තිබේ. එය නම් 1997 ආන්ඩුවේ චක්‍ර ලේඛයක් මගින් පලල් කරනු ලැබ තිබෙන රජයේ ගුරුවරුන් සහ හෙද සේවය, ලිපිකරු සේවය යනාදියේ නිරතව සිටින සේවකයන් අතර වැටුප් විෂමතාව නිවැරදි කිරීමේ ඉල්ලීම යි. මෙම වැටුප් විෂමතාව අහෝසි කල හොත් ගුරුවරුන්ගේ වැටුප මසකට රුපියල් 5,000කින් වැඩි වනු ඇතැයි ඔවුහු කියා සිටිති.

මෙම වැඩ වර්ජනයේ දී මීට වඩා බෙහෙවින් බලගතු කාරනයක් පරදුවට තැබී ඇතැයි සමාජවාදී සමානතා පක්ෂය අනතුරු අඟවයි. ආන්ඩුව ගෙනයන ප්‍රතිගාමී යුද්ධයට කරගැසිය යුත්තේ වැඩ කරන ජනතාව යයි ආන්ඩුව තරයේ කියා සිටී. ආන්ඩුවට ද එය පවත්වාගෙන යන යුද්ධයට ද විරුද්ධව දේශපාලන අරගලයක් කරන්නේ නැතිව වැටුප් හා සේවා කොන්දේසි සඳහා වූ ඉතා සීමිත ව්‍යායාමයක් පවා අසාර්ථක වීම නියත ය.

ජනාධිපති මහින්ද රාජපක්ෂ පසුගිය අගෝස්තු 13 වන දා ආන්ඩුවේ නියෝජිතයන් ද වෘත්තීය සමිති ද අතර පැවති රැස්වීමක දී තම ආස්ථානය පැහැදිලි කලේ ය. යෝජිත වැටුප් වැඩි කිරීම සඳහා රුපියල් බිලියන නමයක් උවමනා බව සමිති නායකයන්ට පෙන්වා දුන් ඔහු මෙසේ ප්‍රශ්න කලේ යඃ "මෙයට යට කිරීමට මුදල් ආන්ඩුව අතේ නැත. ඔබ අපට කියා සිටින්නේ උතුරෙන් හා නැගෙනහිරෙන් හමුදාව ඉවත් කර ගත යුතුයයි කියා ද?"

රාජපක්ෂගේ කතාව වාර්තා කල ලංකා ගුරු සංගමයේ සභාපති ජෝශප් ස්ටැලින් තමන් එයට දුන් පිලිතුර සඳහන් නොකිරීමට වග බලා ගත්තේ ය. වෘත්තීය සමිති ජනාධිපති වරයාට අභියෝග නොකලේ මන්දැයි ඇසූ කල ස්ටැලින් දුන් අබ්බාගාත පිලිතුර නම් "එතකොට ආන්ඩුව වැටුනොත්?" යන්න ය. මෙහි තේරුම නම් වෘත්තීය සමිති ආන්ඩුවට සහයෝගය දෙන බවත් යුද්ධයට විරුද්ධ නැති බවත් ය. සාකච්ඡාවට සම්බන්ධ වූ සමිති පහෙන් එකක් වන ලංකා ගුරු සේවා සංගමය සිටින්නේ යුද්ධය නැවැත්වීමට නොව තව දුරටත් උග්‍ර කිරීමට දැඩි සේ කියා සිටින ජනතා විමුක්ති පෙරමුන හා සම්බන්ධ වී ගෙනය.

සැප්තැම්බර් 6 වන දා සාකච්ඡාවකදී ද ආන්ඩුව එම පනිවිඩයම දුන්නේ ය. සුසිල් ප්‍රේම්ජයන්ත, කරු ජයසූරිය සහ ජෝන් සෙනෙවිරත්න යන ඇමතිවරු සමිති නායකයින්ට කියා සිටියේ මෙයයිඃ "අප සමෘධි වැඩපිලිවෙලට වුනත් වාර්ෂිකව වියදම් කරන්නේ රුපියල් බිලියන 5ක් 6ක් අතර ප්‍රමානයක්. ඉතින් අපි කොහොමද ගුරු වැටුප් රුපියල් බිලියන නමයකින් වැඩි කරන්නේ? අප මෙතරම් විශාල ප්‍රමානයක් ගුරු වැටුප් වැඩි කිරීමට වෙන් කලොත් ආන්ඩුව බිඳ වැටෙයි."

මෙයට වෘත්තීය සමිති නායකයින්ගේ නිවට ප්‍රතිචාරය වූයේ ප්‍රථමයෙන් වැටුප් වැඩි කිරීම අනුමත කරන චක්‍ර ලේඛයක් නිකුත් කරන ලෙසත් ඊට පසු මුදල් සොයාගන්නේ කොහෙන්ද යන්න සාකච්ඡා කරන ලෙසත් ය. වෙනත් වචනවලින් කිවහොත් ඔවුන් කියා සිටින්නේ කෝපාවිෂ්ඨව සිටින තම සාමාජිකයින් සැනසීම සඳහා වැඩකට නැති කඩදාසි කොලයක් හෝ නිකුත් කරන ලෙස ය. මෙයින් පෙන්නුම් කෙරෙන්නේ වැටුප් වැඩි කරවීමට අදහසක් මොවුන්ට ඇත්තේම නැති බවය. එහෙත් අපේක්ෂා කල හැකි පරිදි ම ඇමතියෝ මෙම උපාමාරුව ප්‍රතික්ෂේප කලහඃ ප්‍රමුඛවන්නේ යුද්ධය යයි අවධාරනය කලහ.

ආන්ඩුව පසු ගිය නොවැම්බර් අයවැය ලේඛනයෙන් 2007 සඳහා යුද වියදම දැවැන්ත රුපියල් බිලියන 139කින් ඉහල දැම්මේ ය. මෙය 2006 යුද වියදමට වඩා සියයට 45ක වැඩි කිරීමකි.

ඉන් නොනැවතුනු ආන්ඩුව කලින් නැගෙනහිර ද දැන් උතුරේ ද යුද්ධ ප්‍රයත්නය උග්‍ර කරමින් යුද වියදම් ද තවතවත් ඉහල දැමී යඃ යාන්තම් සතියකට පෙර පාර්ලිමේන්තුවෙන් සම්මත කරගත් නව බදු පනත් මගින් හිස්භාන්ඩාගාරය පුරවාගෙන යුද වියදම ඉහල දැමීම සඳහා වැඩ කරන ජනතාවගේ සාක්කුවලින් මුදල් උදුරා ගැනීමට අලුත් පනත් සම්මත කලේ ය.

රාජපක්ෂ ප්‍රජාතන්ත්‍ර අයිතිවාසිකම් පාගා දැමීම සඳහා ද යුද්ධය යොදා ගනී. හදිසි නීති ද ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ද අතැතිව සිටින ජනාධිපතිවරයාට දැන් වැඩ වර්ජන හා විරෝධතා නීති විරෝධී යයි මර්දනය කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවා නියෝග පැනැවිය හැකි ය.

ඇමතිවරු තමන්ට දැක්වෙන විරුද්ධත්වය හා එල්ල වන විවේචන "සතුරාට ආධාර කිරීම්" යයි නිරන්තරව හංවඩු ගසති. ජන මාධ්‍යයන්ට තරවටු කොට තර්ජනය කොට දාමරික පහරදීම්වලට ලක් කර ඇත. බිය ගැන්වීමේ හා ත්‍රස්තයේ තම මෙහෙයුම්වල කොටසක් ලෙස සිය ගනන් ජනයා අතුරුදහන් කිරීමට ද මරා දැමීමට ද ආරක්ෂක හමුදා හවුල් ව ඇත. ගොදුරු වූ ජනයාගෙන් බොහෝ දෙනෙක් දෙමල මිනිස්සු ය.

වැඩ කරන ජනයා මෙම වර්ගවාදී යුද්ධයට කැප කල යුතු යයි ආන්ඩුව බල කර සිටී. රාජ්‍ය අංශයේ සේවකයින් වේවා, සරසවි සිසුන් වේවා ගොවියන් ධීවරයන් වේවා සරසවි සේවකයන් හෝ වතු කම්කරුවන් වේවා තමන්ගේ අයිතිවාසිකම් සඳහා සටන් කරන ඕනෑම කෙනෙකුට එරෙහිව "රට පාවාදීමේ අපරාධය" පිලිබඳ චෝදනාව එල්ල කෙරෙයි. මැයි මාසයේ වෘත්තිය සමිති නායකයන් සමග පැවති සාකච්ඡාවක දී ජනාධිපති රාජපක්ෂ "ප්‍රභාකරන්ට තත්වය සකස් කර දීම" ගැන සමහර සමිති නායකයන්ට කෙලින්ම චෝදනා කලේ ය. කිසිවෙකුත් ඔහුට අභියෝග නොකලහ.

වෘත්තීය සමිති සෑම අවස්ථාවක දී ම ආන්ඩුවට දනගසා ඇත. පසු ගිය වර්ෂයේ මාර්තු සහ අප්‍රේල් මාසවල දී ගුරුවරු වැටුප් වැඩි කිරීමක් ඉල්ලා සටන් වදින රාජ්‍ය අංශයේ කම්කරුවන්ගේ සන්ධානයකට එකතු වූහ. එහෙත් ආන්ඩුව වැඩ වර්ජන "ජාතික ආරක්ෂාවට" තර්ජනයක් යයි හෙලාදුටු කල්හි පසුබැසි වෘත්තීය සමිති තම ප්‍රයත්නය අතහැර දමා මූනිච්චාවට පත්කරන ලද ව්‍යාජ ජාතික වැටුප් සමාලෝචක කමිටුවක් පිලිගත්හ.

මෙම යුද්ධය වනාහී අතීතයේ හා වර්තමානයේ ආන්ඩු රටෙහි උග්‍රවන්නා වූ සමාජ හා ආර්ථික අර්බුදය විසඳලීමට අසමත් වීමේ විපාකයකි. ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කිරීමේ පුද්ගලීකරනයේ සහ රාජ්‍ය අංශයේ කප්පාදු යනාදී ඔවුන්ගේ පිලිවෙත් දුප්පත් පෝසත් ජනයා අතර භේදය උග්‍ර කර ඇත. අධ්‍යාපන අංශයේ ලා පුද්ගලික පාසල්වලට දොර විවෘත කල ආන්ඩුව ගාස්තු අය කරන විදේශ විශ්වවිද්‍යාලයන්ට හතු පිපෙන්නාසේ වැඩීමට ඉඩ සලසා දී තිබේ. උසස් අධ්‍යාපනය සඳහා මෙම වර්ෂයේ වෙන් කරන ලද මුදල සියයට 20 කින් කප්පාදු කරන ලදී.

රාජපක්ෂ, ඔහුට පෙර සිටි සියලු පාලකයන් මෙන්ම වැඩෙන්නා වූ සමාජ අසහනයේ රෝගලක්ෂනයන්ට ප්‍රතිචාර දැක්වූයේ නරුම ලෙස ජාතිවාදී වෛරය අවුස්සා ලමිනි; එමගින් දිවයින යලිත් වරක් විනාශකාරී යුද්ධයට ඇද දමමිනි. මෙම පිලිවෙත වනාහී කොලඹ පාලක පන්තිය තමන්ගේ බ්‍රිතාන්‍ය යටත්විජිත ස්වාමිවරුන්ගෙන් උරුම කරගත්, "බෙදා පාලනය කිරීමේ" ආනාදීකාලීන ආප්තයයි. ශතවර්ෂ කාලක් පමන තිස්සේ දිග් ගැසෙමින් 70,000කට අධික ජන සංඛ්‍යාවක් මරනයට පත් කරමින් තවත් ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ ජීවිත විනාශ කල සිවිල් යුද්ධය අවසන් කර ගැනීමට නොහැකිවීම වනාහී ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූවන්හි බංකොලොත්බව ඔප්පු කරන දරුනුම සාක්ෂිය යි.

කම්කරුවන් උගතයුතු වන මූලික දේශපාලන පාඩම නම් යුද්ධයට එරෙහිවන්නා වූ සමාජවාදී ක්‍රියාමාර්ගයක් නැතිව වැටුප්, සේවා තත්වයන් හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කරගත නොහැකි බවය. කම්කරු පන්තියට තමන්ගේ ම ස්වාධීන පන්ති අවශ්‍යතාවයන් පෝෂනය කර ගත හැක්කේ සකලාකාර ජාතිවාදය සහ වර්ගවාදය ප්‍රතික්ෂප කිරීමෙන් පමනි. සිංහල ජාත්‍යොත්තමවාදය මෙන්ම එල්ටීටීඊයේ බෙදුම් වාදය යන මේ දෙකම සේවය කරන්නේ පාලක ප්‍රභූන්ගේ පටු උවමනාකම්වලට මිස ජීවන තත්වයන්ගේ කඩා වැටීමට එක හා සමානව මුහුන දී සිටින්නාවූ සිංහල හා දෙමල කම්කරුවන්ගේ අවශ්‍යතාවයන්ට නම් නො වේ.

දිවයිනේ උතුරෙන් සහ නැගෙනහිරෙන් ආරක්ෂක හමුදා වහාම ද කොන්දේසි විරහිතව ද ඉවත් කල යුතු යයි සමාජවාදී සමානතා පක්ෂය බල කර සිටී. මෙම යුද්ධයට එක මිනිහෙක්, එක සතයක් දෙන්නට එපා! හදිසි අවස්ථා රෙකුලාසි ද අත්‍යවශ්‍ය සේවා නියමයන් ද ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ද ඇතුලු සියලු ප්‍රජාතන්ත්‍ර විරෝධී නීති අහෝසි කරනු! යයි සමාජවාදී සමානතා පක්ෂය කියා සිටී.

ඉරාකයේ සහ ඇෆ්ඝනිස්තානයේ යුද්ධය කරගෙන යන අධිරාජ්‍ය බලවතුන් ම ඉදිරිපත් කරන ඊනියා ව්‍යාජ ජාත්‍යන්තර "සාම ක්‍රියාදාම" කෙරෙහි කම්කරුවන් මොනම විශ්වාසයක් හෝ තැබිය යුත්තේ නැත. මේ ඊනියා සාම ක්‍රියාදාමයන්ගේ අරමුන වන්නේ ලංකාව විදේශ අයෝජකයන් සඳහා ලාභ ශ්‍රම වේදිකාවක් බවට පත් කර ගැනීම සඳහා ආන්ඩුව සහ එල්ටීටීඊය අතර ගනුදෙනුවකි. ශ්‍රම සූරා කෑම උග්‍ර කිරීමේ මෙම සැලැස්මට එරෙහිව සමාජවාදී සමානතා පක්ෂය මුලුමහත් කම්කරු පන්තියෙන් ඉල්ලා සිටින්නේ සමාජවාදී පිලිවෙත් ක්‍රියාත්මක කිරීම සඳහා කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ආන්ඩුවක් පිහිටුවීමේ අරගලය වටා ඒකාබද්ධ වන ලෙසය.

අප සටන්වදින්නේ දකුනු ආසියාවේ ද ජාත්‍යන්තරව ම ද සමාජවාදී සමූහාන්ඩු සම්මේලනයක කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ හා ඊලම් හි සමාජවාදී සමූහාන්ඩුවක් ගොඩනැගීමට ය.

මෙම ජාත්‍යන්තරවාදී සමාජවාදී ඉදිරි දර්ශනය සඳහා සටන් කිරීමට තම පන්තියේ පෘථුල පක්ෂයක් ගොඩනගා ගැනීම කම්කරු පන්තියට අවශ්‍ය ය.

අපේ ක්‍රියා මාර්ගය අධ්‍යයන කොට ලෝක සමාජවාදී වෙබ් අඩවිය කියවමින් හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකාවේ ශාඛාව ගොඩනගාගැනීමට අපි ගුරුවරුන්ගෙන් ද, තරුන ජනයාගෙන් ද කම්කරුවන්ගෙන් ද ඉල්ලා සිටිමු.

© www.wsws.org